# 25 සම්භාවිතාව

**මෙම පාඩම උගනීමෙන් ඔබට**

- රුක් සටහන් හඳුන්වා දීම සහ නියැදි අවකාශය රුක් සටහනක දැක්වීම
- රුක් සටහන් මගින් ගැටලු විසඳීම

**පිළිබඳ මනා අවබෝධයක් ලබා ගත හැකි ය.**

විය හැකියාවන් නිරූපණය කිරීමේ විවිධ ක්‍රම මගින් එදිනෙද ජීවිතයේ දී හමු වන සිද්ධිවලට අදාළ අර්ථ දැක්වීම් සම්බන්ධ ව ඔබ උගත් කරුණු සිහිපත් කර ගැනීම ඉතා වැදගත් වේ.

## 25.1 නියැදි අවකාශය

සසම්භාවී පරීක්ෂණයක දී විය හැකි සියලු ප්‍රතිඵල අඩංගු කුලකය එම පරීක්ෂණයේ **නියැදි අවකාශය** නම් වේ. මෙය සාමාන්‍යයෙන් "S" මගින් අංකනය කෙරේ.

**නිදසුන 1.**

(i) නොනැඹුරු කාසියක් උඩ දැමීම යන සසම්භාවී පරීක්ෂණයේ නියැදි අවකාශය $S = \{H,T\}$, මෙහි සිරස වැටීම H ලෙස ද, අගය වැටීම T ලෙසද හැඳින්වේ.

(ii) පැති 1 සිට 6 තෙක් නම් කර ඇති සාධාරණ දදු කැටයක් උඩ දැමීමේ සසම්භාවී පරීක්ෂණයේ නියැදි අවකාශය

$S = \{1, 2, 3, 4, 5, 6\}$ වේ.

(iii) අලුත ඉපදුණ දරුවා ගැහැනු දරුවකු ද පිරිමි දරුවකු ද යන්න සෙවීමේ සසම්භාවී පරීක්ෂණයේ නියැදි අවකාශය

$S = \{M, F\}$, මෙහි ගැහැනු දරුවකු වීම F මගින්, පිරිමි දරුවෙකු වීම M මගින් ද දැක්වේ.

## 25.2 සිද්ධි

සිද්ධි : සිද්ධියක් යනු නියැදි අවකාශයේ උපකුලකයකි.

**නිදසුන 2.**

(i) කාසියක් උඩ දැමීමේ දී සිරස ලැබීම සිද්ධියක් වේ. මෙය A ලෙස හැඳින්වුවහොත් $A=\{H\}$ වේ. පැහැදිලි ව ම මෙය $S=\{H,T\}$ යන නියැදි අවකාශයේ උපකුලකයක් වේ.

(ii) දාදු කැටයක් උඩ දැමීමේ දී ඔත්තේ සංඛ්‍යාවක් ලැබීම ද සිද්ධියක් වේ. මෙය B මගින් හැඳින්වුව හොත්,

$B=\{1,3,5\}$ වේ. පැහැදිලි ව ම මෙය

$S=\{1,2,3,4,5,6\}$ නියැදි අවකාශයේ උපකුලකයකි.

## 25.3 සරල සිද්ධි

යම් සිද්ධියක් සිද්ධීන් වශයෙන් තව දුරටත් බෙදිය නොහැකි නම් එවැනි සිද්ධියකට සරල සිද්ධියක් යැයි කියනු ලැබේ. එනම් සිද්ධියක් සරල සිද්ධියක් වන විට එහි අඩංගු වන්නේ එක් අවයවයක් පමණි.

**නිදසුන 3.**

(i) කාසියක් උඩ දැමීමේ දී සිරස ලැබීමේ සිද්ධිය සරල සිද්ධියක් වේ. මෙහි ඇත්තේ H යන අවයවය පමණි.

(ii) දාදු කැටයක් උඩදැමීමේ සසම්භාවී පරීක්ෂණයේ නියැදි අවකාශයේ $S=\{1,2,3,4,5,6\}$ වේ. මෙහි සරල සිද්ධි මෙසේ දැක්විය හැක.

$\{1\},\{2\},\{3\},\{4\},\{5\},\{6\}$

| ඕනෑ ම සිද්ධියක් සරල සිද්ධිවල මේලයක් ලෙස ප්‍රකාශ කළ හැකි ය. |
|---|

නියැදි අවකාශය ද සිද්ධියකි. ඉහත (ii) නිදසුනට අනුව

$S=\{1\}\cup\{2\}\cup\{3\}\cup\{4\}\cup\{5\}\cup\{6\}$ වේ.

## 25.4 සංයුක්ත සිද්ධි

යම් සිද්ධියක් සිද්ධීන් දෙකකට හෝ ඊට වැඩි ගණනකට බෙදිය හැකි නම් එම සිද්ධිය සංයුක්ත සිද්ධියක් ලෙස හැඳින්වේ.

**නිදසුන 4.**

(i) දදු කැටයක් උඩ දැමීමේ දී ඔත්තේ සංඛ්‍යාවක් ලැබීමේ සිද්ධිය සංයුක්ත සිද්ධියක් වේ.

A = දදු කැටයක් උඩ දැමීමේ දී ඔත්තේ සංඛ්‍යාවක් ලැබීම.

$A = \{1, 3, 5\}$

මෙය $\{1\}, \{3\}, \{5\}, \{1, 3\}, \{1, 5\}, \{3, 5\}$

ලෙස සිද්ධීන් ගණනාවකට බෙදිය හැක.

## 25.5 අන්‍යෝන්‍ය වශයෙන් බහිෂ්කාර සිද්ධීන්

නියැදි අවකාශයක සිද්ධීන් දෙකක් හෝ ඊට වැඩි ගණනක් අතර පොදු සරල සිද්ධි කිසිවක් නොමැති නම් ඒවා අන්‍යෝන්‍ය වශයෙන් බහිෂ්කාර සිද්ධි ලෙස හැඳින් වේ.

A හා B ඕනෑ ම සිද්ධි දෙක සඳහා $A \cap B = \phi$ නම්, A හා B අන්‍යෝන්‍ය වශයෙන් බහිෂ්කාර වේ.

**නිදසුන 5.**

දදු කැටයක් උඩ දැමීම පිළිබඳ සසම්භාවී පරික්ෂණයේ දී

A− ඔත්තේ සංඛ්‍යාවක් ලැබීම,

B− ඉරට්ට සංඛ්‍යාවක් ලැබීම.

යන සිද්ධීන් දෙක සැලකීමේ දී

$A = \{1, 3, 5\}$ , $B = \{2, 4, 6\}$ නිසා

$A \cap B = \phi$ වේ.

(ඔත්තේ සංඛ්‍යාවක් ලැබීම හා ඉරට්ටේ සංඛ්‍යාවක් ලැබීම එකවර සිදු විය නොහැකි ය.)

$\therefore$ A හා B අන්‍යෝන්‍ය වශයෙන් බහිෂ්කාර සිද්ධි වේ.

## 25.6 සම්භාවිතාව

සම්භාවිතාව පිළිබඳ ඔබ මෙතෙක් ඉගෙන ගත් කරුණු නැවත ආවර්ජනය කරමු. සිද්ධියක සම්භාවිතාව යනු එම සිද්ධිය සිදු වීමට ඇති හැකියාව වේ. මෙහි දී අප මුලින් ම සම්භාවිතාව අර්ථ දක්වන ලද්දේ සම සේ භව්‍ය සිද්ධිවලටයි.

**නිදසුන 6.**

නොනැඹුරු දදු කැටයක් උඩ දැමීමේ සසම්භාවී පරීක්ෂණය සලකමු.

$S = \{1, 2, 3, 4, 5, 6\}$

මෙම නියැදි අවකාශයට අනුරූප සරල සිද්ධි මෙසේයි.

$\{1\}, \{2\}, \{3\}, \{4\}, \{5\}, \{6\}$

$A = \{2\}$ නම් A නම් සරල සිද්ධිය සිදුවීමේ සම්භාවිතාව $P(A)$ ලෙස සටහන් කරනු ලබන අතර

$P(A) = \dfrac{n(A)}{n(S)} = \dfrac{1}{6}$ ලෙස අර්ථ දක්වූ බව ඔබට මතක ඇති. මෙහි $n(s)$ මගින්

S නියැදි අවකාශයේ අවයව ගණන දක්වේ. ඉහත සරල සිද්ධි සියල්ලේ ම සම්භාවිතාව $\dfrac{1}{6}$ වන බව ඔබට පැහැදිලි ය. මෙසේ නියැදි අවකාශයේ වූ සියලු ම සරල සිද්ධි සඳහා එක ම සම්භාවිතායක් ඇත්නම් එම සිද්ධිවලට **සම සේ භව්‍ය** සිද්ධි යයි කියනු ලැබේ.

> සරල සිද්ධීන් සියල්ල අන්‍යෝන්‍ය වශයෙන් බහිෂ්කාර වන අතර ඒවා සම සේ භව්‍ය නම් සම්භාවිතාවන්ගේ ඓක්‍යය එකට සමාන වේ.

දැන් සමසේ භව්‍ය සරල සිද්ධිවලින් සමන්විත වූ සංයුක්ත සිද්ධියක් සලකමු.

X – ඔත්තේ සංඛ්‍යාවක් ලැබීම.

$X = \{1, 3, 5\}$

මෙවැනි සංයුක්ත සිද්ධියක සම්භාවිතාව

$$P(X) = \frac{n(X)}{n(S)} = \frac{3}{6} = \frac{1}{2}$$ වේ.

> සම සේ භාව්‍ය සරල සිද්ධීන් ගෙන් සමන්විත සසම්භාවී පරීක්ෂණයක නියැදි අවකාශය $S$ ද එහි ඕනෑ ම සංයුක්ත සිද්ධියක් $M$ යැයි ද ගනිමු.
>
> $n(S) = N$ ද $n(M) = m$ ද නම්
>
> $$P(M) = \frac{n(M)}{n(S)} = \frac{m}{N}$$ වේ.
>
> මෙහි $o \leqslant P(M) \leqslant 1$

තවද A හා B ඕනෑ ම සිද්ධීන් දෙකක් නම්

$P(A \cup B) = P(A) + P(B) - P(A \cap B)$ බව ද

A හා B අන්‍යෝන්‍ය වශයෙන් බහිෂ්කාර සිද්ධි නම්

$P(A \cup B) = P(A) + P(B)$ බව ද ඔබ උගෙන ඇත.

නිදසුන 7.

(1) විදුලි උපකරණ වෙළඳ සැලක පාරිභෝගිකයන් 75 දෙනෙකු සම්බන්ධ කරමින් සිදු කරන ලද සමීක්ෂණයක දී පහත සඳහන් තොරතුරු සොයා ගන්නා ලදී. 12 දෙනෙකු රෙදි සෝදන යන්ත්‍රයක් මිල දී ගන්නා බව ද 18 දෙනෙකු ශිතකරණයක් මිල දී ගන්නා බව ද 24 දෙනෙකු නව රූපවහිනි යන්ත්‍රයක් මිල දී ගන්නා බව ද 6 දෙනෙකු රෙදි සෝදන යන්ත්‍රයක් හා ශිතකරණයක් මිල දී ගන්නා බව ද 4 දෙනෙකු රෙදි සෝදන යන්ත්‍රයක් හා රූපවාහිනී යන්ත්‍රයක් මිල දී ගන්නා බව ,ද 10 දෙනෙකු රූපවහිනියක් හා ශිතකරණයක් මිල දී ගන්නා බව ද පෙනුණි. එක් පුද්ගලයෙකු පමණක් ඉහත උපකරණ තුන ම මිල දී ගන්නා බව ද පෙනුණි.

(i) මෙම තොරතුරු වෙන් රූප සටහනක දක්වන්න.

(ii) මෙම පුද්ගලයන්ගෙන් අහඹු ලෙස පුද්ගලයකු ගත් විට ඔහු,

(a) මෙහි සඳහන් උපකරණයක් මිල දී නොගත්තකු වීමේ

(b) රෙදි සෝදන යන්ත්‍රයක් පමණක් මිල දී ගන්නා අයකු වීමේ

(c) රූපවාහිනියක් පමණක් මිල දී ගන්නා අයකු වීමේ

(d) ශීතකරණයක් පමණක් මිල දී ගන්නා අයකු වීමේ

(e) රූපවාහිනි යන්ත්‍රයක් හා ශීතකරණයක් යන උපකරණ දෙකින් යටත් පිරිසෙයින් එක් උපකරණයක්වත් මිල දී ගන්නා අයකු වීමේ සම්භාවිතාව සොයන්න.

M - රෙදි සෝදන යන්ත්‍රයක් මිල දී ගන්නා අය කුලකය

R - රූපවාහිනී යන්ත්‍රයක් මිල දී ගන්නා අය කුලකය

C - ශීතකරණයක් මිල දී ගන්නා අය කුලකය

(i)




(ii) (a) මෙහි සඳහන් උපකරණයක් මිල දී නොගන්නා අයකු වීමේ සම්භාවිතාව

$$= P(M \cup C \cup R)'$$

$$= \frac{n(M \cup C \cup R)'}{n(S)} = \frac{40}{75} = \frac{8}{15}$$

(b) රෙදි සෝදන යන්ත්‍රයක් පමණක් මිල දී ගන්නා අයකු වීමේ සම්භාවිතාව

$$= P(M \cap (C \cup R)') = \frac{3}{75} = \frac{1}{25}$$

(c) රූපවාහිනී යන්ත්‍රයක් පමණක් මිල දී ගන්නා අයකු වීමේ සම්භාවිතාව

$$= P(R \cap (M \cup C)') = \frac{11}{75}$$

(d) ශීතකරණයක් පමණක් මිල දී ගන්නා අයෙකු වීමේ සම්භාවිතාව

$$= P(C \cap (M \cup R)') = \frac{3}{75}$$

(e) රූපවාහිනී යන්ත්‍රයක් හා ශීතකරණයක් යන දෙකෙන් යටත් පිරිසෙන් එක් උපකරණයක්වත් මිල දී ගන්නා අයකු වීමේ සම්භාවිතාව

$$= P(C \cup R) = \frac{n(C \cup R)}{n(S)}$$

$$= \frac{32}{75}$$

## 25.1 ක්‍රියාකාරකම

ඉහත (7) නිදසුනෙහි ඇති තොරතුරුවලින්

$P(M \cup R \cup C) = P(M) + P(R) + P(C) - P(M \cap R)$

$- P(M \cap C) - P(R \cap C) + P(M \cap R \cap C)$ සමීකරණය සත්‍යාපනය කරන්න.

## 25.1 අභ්‍යාසය

(1) පාබල හමුදාව, ගුවන් හමුදාව, නාවික හමුදාව අතරින් තමන් බැඳීමට කැමති කිනම් හමුදාවට දැයි සිසුන් 46 දෙනෙකුගෙන් විමසූ විට පාබල හමුදාවට කැමති 21 දෙනෙකු ද, ගුවන් හමුදවට බැඳීමට කැමති 14 දෙනෙක් ද, නාවික හමුදවට බැඳීමට කැමති 23 දෙනෙකු ද, මෙම තුනට ම බැඳීමට කැමති අය 5 දෙනෙකු ද, පාබල හමුදාව හා ගුවන් හමුදවට බැඳීමට කැමති අය 7 දෙනෙකු ද පාබල හමුදාව හා නාවික හමුදවට පමණක් බැඳීමට කැමති අය 8 දෙනෙකු ද ගුවන් හමුදවට පමණක් බැඳීමට කැමති අය 4 දෙනෙකු ද සිටි බව පෙනුණි.

- මෙම තොරතුරු වෙන් සටහනක් මගින් දක්වන්න.
- මෙම සිසුන්ගෙන් අහඹු ලෙස සිසුවකු තේරූ විට ඔහු,

  (a) පාබල හමුදවට බැඳීමට පමණක් කැමති කෙනෙකු වීමේ
  (b) නාවික හමුදවට පමණක් බැඳීමට කැමති කෙනෙකු වීමට
  (c) මෙම තුනෙන් එකකටවත් බැඳීමට කැමති නැති, කෙනෙකු වීමේ සම්භාවිතා සොයන්න.

(2) බෑගයක හැඩයෙන් හා ප්‍රමාණයෙන් සමාන වූ කෘත්‍රිම මුතු ඇට 10ක් තිබේ. එයින් 5ක් සුදු පාටය. 3 ක් රතු පාට ය. 2 ක් කළු පාට ය. අහඹු ලෙස මුතු ඇටයක් ගෙන ආපසු නො දමා තවත් මුතු ඇටයක් ගන්නා ලදී.

- මෙම පරීක්ෂණයේ නියැදි අවකාශය කාටීසීය තලයක සටහන් කරන්න.
- ගන්නා ලද මුතු ඇට දෙක ම,

  (a) සුදු පාට මුතු ඇට වීමේ
  (b) රතුපාට මුතු ඇට වීමේ
  (c) කළුපාට මුතු ඇට වීමේ
  (d) එකක් සුදුපාට මුතු ඇටයක් වීමේ හා අනික රතුපාට මුතු ඇටයක් වීමේ
  (e) දෙක ම වෙනස් පාටවලින් යුක්ත මුතු ඇට වීමේ

සම්භාවිතා සොයන්න.

## 25.7 ස්වායත්ත සිද්ධි

ස්වායත්තතාව සම්භාවිතාවේ දී එන ඉතා වැදගත් සංකල්පයකි. පහත සඳහන් නිදසුන් මගින් එය මෙසේ පැහැදිලි කළ හැකි ය.

**නිදසුන 8.**

ළමුන් 36 දෙනෙකුගෙන් සමන්විත ශිෂ්‍ය කණ්ඩායමක් සලකන්න.

A – නිල්පාට ඇස් ඇති අයකු වීම.
B – පිරිමි ළමයකු වීම.

ඒ හා සම්බන්ධ තොරතුරු පහත වගුවේ ඇත.

| | A | $A'$ | එකතුව |
|---|---|---|---|
| B | 6 | 6 | 12 |
| $B'$ | 12 | 12 | 24 |
| එකතුව | 18 | 18 | 36 |

මෙහි $A'$ නිල් පාට ඇස් ඇති අයකු නොවීම හා
$B'$ පිරිමි ළමයකු නොවීම යන සිද්ධි නිරූපණය වේ. මේ අනුව ඉහත කණ්ඩායමෙන් අහඹු ලෙස ළමයෙකු තෝරා ගත හොත්, එම ළමයා සම්බන්ධ ව පහත සඳහන් සම්භාවිතාවන් සෙවිය හැකි ය.

$$P(A) = \frac{18}{36} = \frac{1}{2}$$

$$P(B) = \frac{12}{36} = \frac{1}{3}$$

$$P(A \cap B) = \frac{6}{36} = \frac{1}{6}$$

තව ද $P(A) \times P(B) = \frac{1}{2} \times \frac{1}{3}$

$$= \frac{1}{6}$$

$$= P(A \cap B)$$

$\therefore P(A \cap B) = P(A).P(B)$ වේ.

තවද ඉහත $A$ හා $B$ සිද්ධි දෙකේ , $A$ සිද්ධියේ සිදු වීම හෝ සිදු නොවීම කෙරෙහි $B$ සිද්ධිය බල නොපායි. එනම් කණ්ඩායමෙන් ළමයෙකු තෝරා ගත හොත්, එම ළමයා පිරිමි ළමයකු වීම හෝ නොවීම එම ළමයා නිල් ඇස් ඇති අයකු වීම හෝ නොවීම කෙරෙහි බල නො පායි

මෙවැනි සිද්ධිවලට **ස්වායත්ත සිද්ධි** යැයි කියනු ලැබේ.

$A$ හා $B$ ස්වායත්ත සිද්ධි දෙකක් නම්

$P(A \cap B) = P(A).P(B)$ වේ.

මෙහි විලෝමය ද සත්‍ය වේ. එනම්

$A$ හා $B$ සිද්ධි දෙකක් සඳහා

$P(A \cap B) = P(A).P(B)$ නම් එම සිද්ධි ස්වායත්ත වේ.

**නිදසුන 9.**

(1) සර්වසම කාසි දෙකක් එක වර උඩ දමන්නේ යයි සිතමු

$S = \{HH, HT, TH, TT\}$ වේ.

$A -$ පළමු කාසියේ අනිවාර්යයෙන් ම සිරස ලැබීම

$B -$ දෙවන කාසියේ අනිවාර්යයෙන් ම සිරස ලැබීම

$C -$ එක් කාසියකින් පමණක් සිරස ලැබීම

$\therefore A = \{HH, HT\}$ , $B = \{HH, TH\}$

$C = \{HT, TH\}$

$\therefore P(A) = P(B) = P(C) = \frac{2}{4} = \frac{1}{2}$ වේ.

$P(A\cap C)=\frac{1}{4}, P(A\cap B)=\frac{1}{4}, P(B\cap C)=\frac{1}{4}$

$\therefore P(A\cap C)=P(A).P(C)$ ද $P(A\cap B)=P(A).P(B)$ ද

$P(B\cap C)=P(B).P(C)$ ද වේ.

$\therefore$ A හා C ද A හා B ද B හා C ද යුගල වශයෙන් ස්වායත්ත වේ.

> ඉහත නිදසුනේ
>
> $P(A\cap B\cap C)= P(A).P(B).P(C)$ යන්න
>
> සත්‍ය ද? සාකච්ඡා කරන්න.

## 25.2 අභ්‍යාසය

(1) පැති 1 සිට 6 තෙක් නම් කර ඇති එකක් රතු පාට සහ අනෙක කොළපාට වූ දාදු කැට දෙකක් උඩ දැමීමේ දී ලැබෙන නියැදි අවකාශය ලක්ෂ්‍යය ප්‍රස්තාරයක දක්වන්න.

රතු පාට දාදු කැටයෙන් 5 ලැබීම A නම් හා

කොළ පාට දාදු කැටයෙන් 6 ලැබීම B නම්

A හා B ස්වායත්ත සිද්ධි බව පෙන්වන්න.

(2) සාධාරණ කාසියක් තුන් වරක් උඩ දමනු ලැබේ.

(i) නියැදි අවකාශය ලියා දක්වන්න

(ii) පළමු වන වාරයේ දී අගය ලැබීම A ද

දෙවැනි වාරයේ දි අගය ලැබීම B ද

වාර තුනේ දීම සිරස දෙකක් පමණක් ලැබීම C ද නම්

A, B හා C සිද්ධිවලින් කුමන ඒවා ස්වායත්ත සිද්ධි ද?

(3) ප්‍රමාණාත්මක යම් භාණ්ඩයක් A නම් පෙට්ටියක 8 ක් ද , මෙයින් 3ක් දෝෂ සහිත ව ද, B නම් පෙට්ටියක 5 ක්ද, එයින් 2 ක් දෝෂ සහිත ව ද පවතී . එක් එක් පෙට්ටියෙන් එක් භාණ්ඩය බැගින් අහඹු ලෙස පිටතට ගනු ලැබේ.

(a) භාණ්ඩ දෙක ම දෝෂ රහිත ඒවා වීමේ

(b) එක් භාණ්ඩයක් දෝෂ සහිත ද, අනෙක දෝෂ රහිත ද වීමේ

(c) A පෙට්ටියෙන් දෝෂ සහිත භාණ්ඩයක් ලැබීමේ

(d) B පෙට්ටියෙන් දෝෂ සහිත භාණ්ඩයක් වීමේ

සම්භාවිතා සොයන්න.

(4) A හා B දෙදෙනා ඉලක්කයට වෙඩි තැබීමේ ක්‍රීඩාවේ යෙදෙති. A ඉලක්කයට වෙඩි තැබීම සාර්ථක වීමේ සම්භාවිතාව $\frac{1}{4}$ ද B ඉලක්කයට වෙඩි තැබීම සාර්ථක වීමේ සම්භාවිතාව $\frac{1}{3}$ ද වේ.

(i) දෙදෙනා ම ඉලක්කයට වෙඩි තැබීම සාර්ථක වීමේ
(ii) යටත් පිරිසෙන් එක් අයකු හෝ ඉලක්කයට වෙඩි තැබීම සාර්ථක වීමේ

(5) A,B හා C නම් අශ්වයන් 3 දෙනෙකු දිවීමට තරඟයකට සහභාගි කෙරෙයි. ඒ ඒ අශ්වයා දිනීමේ සම්භාවිතාවය $P(A)=\frac{1}{2}$ ද, $P(B)=\frac{1}{3}$ හා $P(C)=\frac{1}{6}$ ද වේ. තරගය දෙවතාවක් පැවැත්වේ නම් විය හැකි සියලු සිදු වීම් කුලකය ලියන්න. AB යනු පළමු තරගයෙන් A දිනීම හා දෙවන තරගයෙන් B දිනීමේ සිද්ධිය නම් පහත සම්භාවිතාවන් සොයන්න.

$P(AB)$, $P(AC)$, $P(BA)$, $P(BB)$, $P(BC)$
$P(AA)$, $P(CA)$, $P(CB)$, $P(CC)$

**නිදසුන 10**

රුපියල් දෙකේ හා රුපියලේ නොනැඹුරු කාසි දෙකක් උඩ දැමූවිට ලැබිය හැකි ප්‍රතිඵල

(i) රුක් සටහන් මගින් පෙන්වන්න.
(ii) කාසි දෙකෙහි ම සිරස ලැබීමේ සම්භාවිතාව සොයන්න
(iii) එකකවත් සිරස ලැබීමේ සම්භාවිතාව සොයන්න.

සිරස ලැබීම H ලෙස ද අගය ලැබීම T ලෙස ද යෙදූ විට.

<u>රුපියල් දෙකේ කාසිය</u>   <u>රුපියලේ කාසිය</u>   <u>ප්‍රතිඵලය   සම්භාවිතාව</u>




$(H,H) \rightarrow \frac{1}{2}\times\frac{1}{2}=\frac{1}{4}$

$(H,T) \rightarrow \frac{1}{2}\times\frac{1}{2}=\frac{1}{4}$

$(T,H) \rightarrow \frac{1}{2}\times\frac{1}{2}=\frac{1}{4}$

$(T,T) \rightarrow \frac{1}{2}\times\frac{1}{2}=\frac{1}{4}$

$S = \{ (H,H) , (H,T) , (T,H) , (T,T) \}$

කාසි දෙකෙහි ම සිරස ලැබීමේ සම්භාවිතාව $= P(H,H)$

$$P(H,H) = P(H) \times P(H) = \frac{1}{2} \times \frac{1}{2} = \frac{1}{4}$$

(රුපියලේ කාසියේ සිරස ලැබීම හා රුපියල් දෙකේ කාසියේ සිරස ලැබීම ස්වායත්ත සිද්ධීන් වේ.)

[ සටහන : රුක් සටහනේ අතු උඩ ඊට අදළ සම්භාවිතාව ලියා ඇත.]

එක් කාසියකවත් සිරස ලැබීමේ සම්භාවිතාව $= P(H,H) + P(H,T) + P(T,H)$

$$= \frac{1}{4} + \frac{1}{4} + \frac{1}{4} = \frac{3}{4}$$

නමුත් ඉහත නිදසුනේ

$S = \{ (H,H) , (H,T) , (T,H) , (T,T) \}$

$P(S) = 1$ නිසා,

(iii) එක් කාසියකවත් සිරස ලැබීමේ සම්භාවිතාව

$$= 1 - P(T,T) = 1 - \frac{1}{2} \times \frac{1}{2} = 1 - \frac{1}{4} = \frac{3}{4}$$

ලෙස ද ගණනය කළ හැකි ය.

නිදසුන 11.

A හා B නම් පුද්ගලයන් දෙදෙනා ටෙනිස් තරගයකට සහභාගී වීමට නියමිත ය. එක ළඟ පිහිටි තරඟ වාර දෙකක දි දිනන තැනැත්තා ජයග්‍රාහකයාවේ. නියැදි අවකාශය රුක් සටහනකින් ලියා දක්වන්න.



නියැදි අවකාශය මෙසේ දැක්විය හැකි ය.

$$S=\{ (A,A) , (A,B) , (B,A) , (B,B) \}$$

$n(S)= 4$

ඉහත නිදසුන් දෙක මගින් පැහැදිලි කළ අයුරු නියැදි අවකාශය ඉහත ආකාරය සටහන මගින් ඉදිරිපත් කළ හැක. මෙවැනි සටහනකට **රුක් සටහනක්** යයි කියනු ලැබේ. පියවර එකකට වැඩි ප්‍රමාණයකින් සිදුකරන සසම්භාවී පරීක්ෂා සඳහා අදාල නියැදි අවකාශය සොයා ගැනීමේ දී රුක් සටහන ඉතා වැදගත් වේ. තවද එවැනි සසම්භාවී පරීක්ෂාවක වූ සිද්ධියක සම්භාවිතාව සොයා ගැනීමද රුක් සටහන භාවිතයෙන් ඉතා පහසුවෙන් කළ හැක.

**සටහන**

- නොනැඹුරු කාසි දෙකක් එකවර උඩ දැමීමේ දී උඩට හැරෙන පැත්ත නිරීක්ෂණය කිරීමත්
- නොනැඹුරු කාසි දෙකක එකක් උඩ දමා අනතුරුව අනික දැමීමේ දී උඩට හැරෙන පැත්ත නිරීක්ෂණය කිරීමත්
- එක කාසියක් දෙවරක් උඩ දමා උඩට හැරෙන පැත්ත නිරීක්ෂණය කිරීමත් එකම නියැදි අවකාශයක් ලැබිය හැකි පරීක්ෂණ වේ.

## 25.8 ප්‍රතිස්ථාපන සහිත අවස්ථා

**නිදසුන** 12.

බෑගයක හැඩයෙන් හා ප්‍රමාණයෙන් සමාන වූ රතුපාට බෝල 5 ක් හා නිල්පාට බෝල 4 ක් තිබේ. බෑගයෙන් අහඹු ලෙස බෝලයක් ඉවතට ගෙන එහි පාට සටහන් කර ගෙන එය බෑගයට දමා දෙවැනි වරටත් බෝලයක් අහඹු ලෙස ඉවතට ගනු ලැබේ. රුක් සටහනක් මගින් පහත සඳහන් සිද්ධිවල සම්භාවිතාව සොයන්න

1. බෝල දෙක ම රතුපාට බෝල වීම.
2. බෝල දෙක ම නිල් පාට බෝල වීම.
3. එකක් නිල් පාට බෝලයක් ද අනික රතුපාට බෝලයක් ද වීම.
4. යටත් පිරිසෙයින් එකක්වත් රතු පාට බෝලයක් වීම.
5. පළමු ව ගත් බෝලය රතු පාට බෝලයක් වීම.

| පළමු අවස්ථාව | දෙවැනි අවස්ථාව | ප්‍රතිඵල | සම්භාවිතාව |
|---|---|---|---|




| ප්‍රතිඵල | සම්භාවිතාව |
|---|---|
| (R,R) | $\frac{25}{81}$ |
| (R,B) | $\frac{20}{81}$ |
| (B,R) | $\frac{20}{81}$ |
| (B,B) | $\frac{16}{81}$ |

(i) $P(R,R) = \frac{25}{81}$

(ii) $P(B,B) = \frac{16}{81}$

(iii) $P(R,B) + P(B,R) = \frac{20}{81} + \frac{20}{81} = \frac{40}{81}$

(iv) $P(R,R) + P(B,R) + P(R,B) = \frac{25}{81} + \frac{20}{81} + \frac{20}{81} = \frac{65}{81}$

හෝ

$$1 - P(B,B) = 1 - \frac{16}{81} = \frac{65}{81}$$

(v) $P(R,R) + P(R,B) = \frac{25}{81} + \frac{20}{81} = \frac{45}{81} = \frac{15}{27} = \frac{5}{9}$

## 25.3 අභ්‍යාසය

(1) බැගයක එකම ප්‍රමාණයේ වීදුරු බෝල 5 ක් තිබේ. එහි 4ක් කොළ පාටය. අනික කහ පාටය. බෝලයක් බැගයෙන් ගෙන එහි පැහැය සටහන් කර නැවත බැගයටම දමා නැවතත් බෝලයක් අහඹු ලෙස ඉවතට ගනු ලැබේ.

(i) මෙම පරීක්ෂණයට අදාළ නියැදි අවකාශය රැක් සටහනක් මගින් පෙන්වන්න.
(ii) පහත සඳහන් එක් එක් සිද්ධියේ සම්භාවිතාව සොයන්න.

(a) බෝල දෙක ම කොළ පාට බෝල වීම
(b) බෝල දෙක ම කහ පාට බෝල වීම
(c) බෝල දෙක ම එක ම පාට බෝල වීම

(2) ඉලක්කයට වෙඩි තබන තරගයක දී කෙනෙකුගේ සාර්ථක ව ඉලක්කයට වෙඩි තැබීමේ සම්භාවිතාව $\frac{4}{7}$ වේ.

ඔහු දෙවතාවක් ඉලක්කයට වෙඩි තැබුවේ ය.

(i) නියැදි අවකාශය දක්වන්න.
(ii) පහත සඳහන් සිද්ධිවල සම්භාවිතාව සොයන්න.

(a) දෙවතාවක් ම සාර්ථක වීම.
(b) දෙවතාවක් ම අසාර්ථක විම.
(c) යටත් පිරිසෙයින් එක් වතාවක්වත් සාර්ථක වීම.
(d) එක් වතාවක් පමණක් සාර්ථක වීම.

(3) විදුලි බල්බ නිෂ්පාදනය කරන ආයතනයක් බල්බයක ජීව කාලය පැය 1000 ට අඩු වීමේ සම්භාවිතාව $\frac{1}{100}$ යැයි ප්‍රකාශ කරයි. පාරිභෝගිකයෙකු ගත් විදුලි බල්බ දෙකක ජීව කාලය දැක්වෙන රුක් සටහනක් අඳින්න.
(i) විදුලි බල්බ දෙක ම පැය 1000 ට කලින් දැවීයාමේ සම්භාවිතාව සොයන්න.
(ii) විදුලි බල්බ දෙක ම පැය 1000 ට වැඩි කාලයක් නො දැවී පැවතීමේ සම්භාවිතාව සොයන්න.
(iii) අඩුම තරමින් එක බල්බයක්වත් පැය 1000 ට වැඩි කාලයක් නො දැවී පැවතීමේ සම්භාවිතාව සොයන්න.

(4)




රූපයේ දැක්වෙන පරිදි වෘත්තාකාර තහඩු කැබැල්ලක් සමාන වෘත්ත ඛණ්ඩ 5 කට බෙදා 1 සිට 5 දක්වා අංකනය කොට ඇත. ඊ හිසක් භ්‍රමණය වන සේ තහඩුවේ හරි මැදට සවිකොට ඇත. ඊහිස කරකවා නිදහසේ නැවතීමට සැලැස්වූ විට එය නවතින්නේ ඔත්තේ සංඛ්‍යාවකින් දැක්වෙන කොටසක් මත ද , නැත හොත් ඉරට්ටේ සංඛ්‍යාවකින් දැක්වෙන කොටසක් මත ද යන්න සටහන් කරනු ලැබේ. මෙසේ දෙවරක් කැරකවීමෙන් ලැබෙන ප්‍රතිඵල පෙන්වීමට

(i) රුක් සටහනක් අඳින්න.

(ii) වාර දෙකෙහි ම ඔත්තේ සංඛ්‍යාවකින් දැක්වෙන කොටසක් මත නැවතීමේ සම්භාවිතාව සොයන්න.

(iii) පළමු වාරයේ ඉරට්ටේ සංඛ්‍යාවකින් දැක්වෙන කොටසක් මත නැවතීමේ සම්භාවිතාව සොයන්න.

(5) 11 ශ්‍රේණියේ සිසුන් 35 දෙනෙක් චිත්‍ර , සංගීත යන විෂයයන් දෙකින් එකක් තෝරා ගැනීම පිළිබඳ ව සංඛ්‍යාත්මක තොරතුරු පහත දැක්වේ

| | චිත්‍ර | සංගීත |
|---|---|---|
| පිරිමි | 3 | 12 |
| ගැහැනු | 7 | 13 |

(i) නියැදි අවකාශය දැක්වෙන රුක් සටහනක් අඳින්න.

(ii) මෙම පන්තියෙන් ශිෂ්‍යයකු අහඹුලෙස තේරුවේ නම් එම ශිෂ්‍යයා

(a) පිරිමි ළමයකු වීමේ සම්භාවිතාව සොයන්න.

(b) චිත්‍ර විෂයය තෝරා ගත් පිරිමි ළමයකු වීමේ සම්භාවිතාව

(c) සංගීතය තෝරා ගත් ගැහැනු ළමයෙකු වීමේ සම්භාවිතාව සොයන්න

## 25.9 ප්‍රතිස්ථාපන රහිත අවස්ථාව

**නිදසුන** 13.

බෑගයක තිබෙන එක ම හැඩය හා එක ම ප්‍රමාණයේ බෝලවලින් 5ක් රතු පාට බෝල විය. ඉතුරු තුන නිල්පාට බෝල විය. අහඹු ලෙස බෝලයක් ඉවතට ගෙන ආපසු නො දමා තවත් බෝලයක් අහඹු ලෙස ඉවතට ගන්නා ලදී

නියැදි අවකාශය දැක්වෙන රුක් සටහනක් ඇඳ

(i) බෝල දෙක ම රතු පාට බෝල වීමේ සම්භාවිතාව සොයන්න

(ii) එක බෝලයක් පමණක් රතුපාට බෝලයක් වීමේ සම්භාවිතාව සොයන්න.




(i) $P(R,R)=\frac{20}{56}$

(ii) $P(R,B)+P(B,R)=\frac{15}{56}+\frac{15}{56}=\frac{30}{56}=\frac{15}{28}$

## 25.4 අභ්‍යාසය

(1) පෙට්ටියක ඇති එක ම වර්ගයේ පෑන්වලින් 6ක් කළු පාට පෑන් ද ඉතිරි තුන රතු පාට පෑන් ද වේ. පෑන් දෙකක් එකකට පසු එකක් ඉවතට ගනු ලැබේ. ඉවතට ගත් පෑන් අපසු දැමුවේ නැත.
නියැදි අවකාශය දැක්වෙන රුක් සටහන අඳින්න.
- i පෑන් දෙක ම කළු පාට පෑන් වීමේ සම්භාවිතාව සොයන්න
- ii පෑන් දෙක ම රතු පාට පෑන් වීමේ සම්භාවිතාව සොයන්න.
- iii එක් පෑනක් රතුපාට පෑනක් වී අනෙක කළු පාට පෑනක් වීමේ සම්භාවිතාව සොයන්න.

(2) කඩදාසි බෑගයක් තුළ හැඩයෙන් හා ප්‍රමාණයෙන් සමාන වූ බෝල 10ක් ඇත. එහි 6ක් සුදුපාට ය. 3ක් රතුපාට ය. 1ක් කළු පාට ය. බොලයක් ඉවතට ගෙන ආපසු නො දමා තවත් බොලයක් ඉවත ගන්නා ලදී. නියැදි අවකාශය රුක් සටහනක් මගින් දක්වන්න.
- i ඉවතට ගත් බෝල දෙක ම සුදු පාට බෝල වීමේ සම්භාවිතාව සොයන්න.
- ii ඉවතට ගත් බෝල දෙක ම රතුපාට බෝල වීමේ සම්භාවිතාව සොයන්න.
- iii එක් බෝලයක් සුදු පාට බෝලයක් වී අනෙක රතුපාට බෝලයක් වීමේ සම්භාවිතාව සොයන්න.
- iv බෝල දෙක වෙනස් පාට බෝල වීමේ සම්භාවිතාව සොයන්න.

(3) කාර්යාලයක පිරිමි 7 දෙනෙකුත් කාන්තාවෝ 4 දෙනෙකුත් සේවය කරති. එක් දිනක සේවකයෝ දෙදෙනෙක් කෙටි නිවාඩු ලබා කාර්යාලයෙන් නික්ම ගියෝ ය. මෙම සිදු වීමට අදාළ නියැදි අවකාශය රුක් සටහනක් මගින් දක්වන්න.

එමගින්

(i) පිටත් ව ගිය දෙදෙනා ම පිරිමින් වීම.
(ii) පිටත් ව ගිය දෙදෙනා ම කාන්තාවන් වීම.
(iii) පිටත් ව ගිය දෙදෙනාගෙන් එක්කෙනෙකු වත් කාන්තාවකු වීම .
යන සම්භාවිතාව සොයන්න

(4) බසයක සියලු ආසනවල මගීහු අසුන් ගෙන සිටියහ. පිරිමි 6 දෙනෙක් හා කාන්තාවක් සිටගෙන සිටිය හ. එක්තරා නැවතුමක අසුන්ගෙන සිටි දෙන්නෙක් බැස ගියෝ ය. සිට ගෙන සිටි මගීන් අතරින් දෙදෙනෙක් එම ආසනවල අසුන් ගත්තෝ ය. අදළ නියැදි අවකාශය රුක්සටහනක් මගින් දක්වන්න.

(i) අසුන්ගත් දෙදෙනා ම පිරිමින් වීම.
(ii) එක්කෙනෙකු වත් පිරිමියකු වීම යන සිද්ධිවල සම්භාවිතාව සොයන්න.

නිදසුන 14.

A නම් පෙට්ටියක සමාන හැඩය හා ප්‍රමාණයෙන් යුත් කළු පාට පබළු 5 ක් හා සුදු පාට පබළු 3 ක් ද B නම් පෙට්ටියක එම හැඩය හා ප්‍රමාණයෙන් යුත් කළු පාට පබළු 3ක් හා සුදු පාට පබළු 2 ක් තිබේ A නම් පෙට්ටියෙන් අහඹු ලෙස පබළුවක් අරගෙන B නම් පෙට්ටියට දමා අනතුරු ව B නම් පෙට්ටියෙන් අහඹු ලෙස පබළුවක් ගන්නා ලදී. මෙම පරීක්ෂණයට අදළ රුක් සටහනක් ඇඳ එය මගින් B පෙට්ටියෙන් ගන්නා පබළුව කළු පබළුවක් වීමේ සම්භාවිතාව සොයන්න.



| A පෙට්ටිය | B පෙට්ටිය | ප්‍රතිඵල | සම්භාවිතාව |
|---|---|---|---|




| ප්‍රතිඵල | සම්භාවිතාව |
|---|---|
| (B,B) | $\frac{20}{48}$ |
| (B,W) | $\frac{10}{48}$ |
| (W,B) | $\frac{9}{48}$ |
| (W,W) | $\frac{9}{48}$ |

B පෙට්ටියෙන් කළු පබළුවක් ගැනීමේ සම්භාවිතාව

$$P\,(B,B) + P\,(W,B) = \frac{20}{48} + \frac{9}{48} = \frac{29}{48}$$

## 25.5 අභ්‍යාසය

(1) නිල් පාට පෙට්ටියක් තුළ කළු පබලු 5ක් හා සුදු පබළු 3ක් ඇත. කහ පාට පෙට්ටියක් තුළ කළු පබලු 2 ක් හා සුදු පබලු 3 ක් ඇත. පබළු සමාන ඒවා වේ. නිල් පාට පෙට්ටියෙන් පබළුවක් ගෙන පාට සටහන් කර ගෙන කහ පාට පෙට්ටිය තුළට දමනු ලැබේ. අනතුරු ව කහ පාට පෙට්ටියෙන් පබලුවක් ගන්නා ලදී. මෙම තොරතුරුවලට අදළ නියැදි අවකාශය පෙන්වීමට රුක් සටහනක් අඳින්න.

එමගින්

(i) ගත් පබළු දෙක ම කළු පාට පබළු වීමේ සම්භාවිතාව සොයන්න.

(ii) කහ පාට පෙට්ටියෙන් ගත් පබළුව කහ පාට පබළුවක් වීමේ සම්භාවිතාව සොයන්න.

(2) පෙට්ටියක රතු පාට පෑන් 5 ක් හා නිල් පාට පෑන් 2 ක් ඇත. තවත් පෙට්ටියක එම වර්ගයේ ම නිල් පාට පෑන් 2 ක් ඇත. පළමු පෙට්ටියෙන් පෑනක් අහඹු ලෙස ඉවතට ගෙන දෙවැනි පෙට්ටිය තුළට දමන ලදී. අනතුරු ව දෙවැනි පෙට්ටියෙන් අහඹු ලෙස පෑනක් ගන්නා ලදී. මෙම සිද්ධියට අදළ නියැදි අවකාශය රුක් සටහනක් මගින් දක්වන්න. එමගින්

(i) ගත් පෑන් දෙක ම නිල් පාට පෑන් වීමේ

(ii) දෙවැනි පෙට්ටියෙන් ගත් පෑන රතු පෑනක් වීමේ

යන සිද්ධිවල සම්භාවිතාව සොයන්න.

(3) A ගොවිපොළෙහි සිටින සතුන් අතරෙන් 6 දෙනෙක් පිරිමි සතුන් වන අතර ඉතිරි 5 දෙනා ගැහැනු සත්තු වෙති. B ගොවිපොළෙහි 7 දෙනෙක් පිරිමි සතුන් වන අතර දෙදෙනෙක් ගැහැනු සත්තු වෙති. A ගොවිපොළෙන් අහඹු ලෙස ගැහැණු සතෙක් තෝරා B ගොවිපොළට යවන ලදී. අනතුරු ව B ගොවිපොළෙන් සතෙක් අහඹු ලෙස තෝරා ගනු ලැබී ය. මෙම සිද්ධියට අදාළ රුක් සටහනක් අඳින්න. B ගොවිපොළෙන් අවසානයට ගන්නා සතා ගැහැනු සතකු වීමේ සම්භාවිතාව සොයන්න.

## ලඝුගණක
## மடக்கைகள்
## LOGARITHMS

| | 0 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | මධ්‍යන්‍ය අන්තරය இடை வித்தியாசங்கள் Mean Differences 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 10 | 0000 | 0043 | 0086 | 0128 | 0170 | 0212 | 0253 | 0294 | 0334 | 0374 | 4 | 8 | 12 | 17 | 21 | 25 | 29 | 33 | 37 |
| 11 | 0414 | 0453 | 0492 | 0531 | 0569 | 0607 | 0645 | 0682 | 0719 | 0755 | 4 | 8 | 11 | 15 | 19 | 23 | 26 | 30 | 34 |
| 12 | 0792 | 0828 | 0864 | 0899 | 0934 | 0969 | 1004 | 1038 | 1072 | 1106 | 3 | 7 | 10 | 14 | 17 | 21 | 24 | 28 | 31 |
| 13 | 1139 | 1173 | 1206 | 1239 | 1271 | 1303 | 1335 | 1367 | 1399 | 1430 | 3 | 6 | 10 | 13 | 16 | 19 | 23 | 26 | 29 |
| 14 | 1461 | 1492 | 1523 | 1553 | 1584 | 1614 | 1644 | 1673 | 1703 | 1732 | 3 | 6 | 9 | 12 | 15 | 18 | 21 | 24 | 27 |
| 15 | 1761 | 1790 | 1818 | 1847 | 1875 | 1903 | 1931 | 1959 | 1987 | 2014 | 3 | 6 | 8 | 11 | 14 | 17 | 20 | 22 | 25 |
| 16 | 2041 | 2068 | 2095 | 2122 | 2148 | 2175 | 2201 | 2227 | 2253 | 2279 | 3 | 5 | 8 | 11 | 13 | 16 | 18 | 21 | 24 |
| 17 | 2304 | 2330 | 2355 | 2380 | 2405 | 2430 | 2455 | 2480 | 2504 | 2529 | 2 | 5 | 7 | 10 | 12 | 15 | 17 | 20 | 22 |
| 18 | 2553 | 2577 | 2601 | 2625 | 2648 | 2672 | 2695 | 2718 | 2742 | 2765 | 2 | 5 | 7 | 9 | 12 | 14 | 16 | 19 | 21 |
| 19 | 2788 | 2810 | 2833 | 2856 | 2878 | 2900 | 2923 | 2945 | 2967 | 2989 | 2 | 4 | 7 | 9 | 11 | 13 | 16 | 18 | 20 |
| 20 | 3010 | 3032 | 3054 | 3075 | 3096 | 3118 | 3139 | 3160 | 3181 | 3201 | 2 | 4 | 6 | 8 | 11 | 13 | 15 | 17 | 19 |
| 21 | 3222 | 3243 | 3263 | 3284 | 3304 | 3324 | 3345 | 3365 | 3385 | 3404 | 2 | 4 | 6 | 8 | 10 | 12 | 14 | 16 | 18 |
| 22 | 3424 | 3444 | 3464 | 3483 | 3502 | 3522 | 3541 | 3560 | 3579 | 3598 | 2 | 4 | 6 | 8 | 10 | 12 | 14 | 15 | 17 |
| 23 | 3617 | 3636 | 3655 | 3674 | 3692 | 3711 | 3729 | 3747 | 3766 | 3784 | 2 | 4 | 6 | 7 | 9 | 11 | 13 | 15 | 17 |
| 24 | 3802 | 3820 | 3838 | 3856 | 3874 | 3892 | 3909 | 3927 | 3945 | 3962 | 2 | 4 | 5 | 7 | 9 | 11 | 12 | 14 | 16 |
| 25 | 3979 | 3997 | 4014 | 4031 | 4048 | 4065 | 4082 | 4099 | 4116 | 4133 | 2 | 3 | 5 | 7 | 9 | 10 | 12 | 14 | 15 |
| 26 | 4150 | 4166 | 4183 | 4200 | 4216 | 4232 | 4249 | 4265 | 4281 | 4298 | 2 | 3 | 5 | 7 | 8 | 10 | 11 | 13 | 15 |
| 27 | 4314 | 4330 | 4346 | 4362 | 4378 | 4393 | 4409 | 4425 | 4440 | 4456 | 2 | 3 | 5 | 6 | 8 | 9 | 11 | 13 | 14 |
| 28 | 4472 | 4487 | 4502 | 4518 | 4533 | 4548 | 4564 | 4579 | 4594 | 4609 | 2 | 3 | 5 | 6 | 8 | 9 | 11 | 12 | 14 |
| 29 | 4624 | 4639 | 4654 | 4669 | 4683 | 4698 | 4713 | 4728 | 4742 | 4757 | 1 | 3 | 4 | 6 | 7 | 9 | 10 | 12 | 13 |
| 30 | 4771 | 4786 | 4800 | 4814 | 4829 | 4843 | 4857 | 4871 | 4886 | 4900 | 1 | 3 | 4 | 6 | 7 | 9 | 10 | 11 | 13 |
| 31 | 4914 | 4928 | 4942 | 4955 | 4969 | 4983 | 4997 | 5011 | 5024 | 5038 | 1 | 3 | 4 | 6 | 7 | 8 | 10 | 11 | 12 |
| 32 | 5051 | 5065 | 5079 | 5092 | 5105 | 5119 | 5132 | 5145 | 5159 | 5172 | 1 | 3 | 4 | 5 | 7 | 8 | 9 | 11 | 12 |
| 33 | 5185 | 5198 | 5211 | 5224 | 5237 | 5250 | 5263 | 5276 | 5289 | 5302 | 1 | 3 | 4 | 5 | 6 | 8 | 9 | 10 | 12 |
| 34 | 5315 | 5328 | 5340 | 5353 | 5366 | 5378 | 5391 | 5403 | 5416 | 5428 | 1 | 3 | 4 | 5 | 6 | 8 | 9 | 10 | 11 |
| 35 | 5441 | 5453 | 5465 | 5478 | 5490 | 5502 | 5514 | 5527 | 5539 | 5551 | 1 | 2 | 4 | 5 | 6 | 7 | 9 | 10 | 11 |
| 36 | 5563 | 5575 | 5587 | 5599 | 5611 | 5623 | 5635 | 5647 | 5658 | 5670 | 1 | 2 | 4 | 5 | 6 | 7 | 8 | 10 | 11 |
| 37 | 5682 | 5694 | 5705 | 5717 | 5729 | 5740 | 5752 | 5763 | 5775 | 5786 | 1 | 2 | 3 | 5 | 6 | 7 | 8 | 9 | 10 |
| 38 | 5798 | 5809 | 5821 | 5832 | 5843 | 5855 | 5866 | 5877 | 5888 | 5899 | 1 | 2 | 3 | 5 | 6 | 7 | 8 | 9 | 10 |
| 39 | 5911 | 5922 | 5933 | 5944 | 5955 | 5966 | 5977 | 5988 | 5999 | 6010 | 1 | 2 | 3 | 4 | 5 | 7 | 8 | 9 | 10 |
| 40 | 6021 | 6031 | 6042 | 6053 | 6064 | 6075 | 6085 | 6096 | 6107 | 6117 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 8 | 9 | 10 |
| 41 | 6128 | 6138 | 6149 | 6160 | 6170 | 6180 | 6191 | 6201 | 6212 | 6222 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |
| 42 | 6232 | 6243 | 6253 | 6263 | 6274 | 6284 | 6294 | 6304 | 6314 | 6325 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |
| 43 | 6335 | 6345 | 6355 | 6365 | 6375 | 6385 | 6395 | 6405 | 6415 | 6425 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |
| 44 | 6435 | 6444 | 6454 | 6464 | 6474 | 6484 | 6493 | 6503 | 6513 | 6522 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |
| 45 | 6532 | 6542 | 6551 | 6561 | 6571 | 6580 | 6590 | 6599 | 6609 | 6618 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |
| 46 | 6628 | 6637 | 6646 | 6656 | 6665 | 6675 | 6684 | 6693 | 6702 | 6712 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 7 | 8 |
| 47 | 6721 | 6730 | 6739 | 6749 | 6758 | 6767 | 6776 | 6785 | 6794 | 6803 | 1 | 2 | 3 | 4 | 5 | 5 | 6 | 7 | 8 |
| 48 | 6812 | 6821 | 6830 | 6839 | 6848 | 6857 | 6866 | 6875 | 6884 | 6893 | 1 | 2 | 3 | 4 | 4 | 5 | 6 | 7 | 8 |
| 49 | 6902 | 6911 | 6920 | 6928 | 6937 | 6946 | 6955 | 6964 | 6972 | 6981 | 1 | 2 | 3 | 4 | 4 | 5 | 6 | 7 | 8 |
| 50 | 6990 | 6998 | 7007 | 7016 | 7024 | 7033 | 7042 | 7050 | 7059 | 7067 | 1 | 2 | 3 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
| 51 | 7076 | 7084 | 7093 | 7101 | 7110 | 7118 | 7126 | 7135 | 7143 | 7152 | 1 | 2 | 3 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
| 52 | 7160 | 7168 | 7177 | 7185 | 7193 | 7202 | 7210 | 7218 | 7226 | 7235 | 1 | 2 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 7 |
| 53 | 7243 | 7251 | 7259 | 7267 | 7275 | 7284 | 7292 | 7300 | 7308 | 7316 | 1 | 2 | 2 | 3 | 4 | 5 | 6 | 6 | 7 |
| 54 | 7324 | 7332 | 7340 | 7348 | 7356 | 7364 | 7372 | 7380 | 7388 | 7396 | 1 | 2 | 2 | 3 | 4 | 5 | 6 | 6 | 7 |
| | 0 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |



නොමිලේ බෙදා හැරීම පිණිසයි

## ලඝුගණක
## மடக்கைகள்
## LOGARITHMS

| | 0 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | මධ්‍යක අන්තරය / இடை வித்தியாசங்கள் / Mean Differences 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 55 | 7404 | 7412 | 7419 | 7427 | 7435 | 7443 | 7451 | 7459 | 7466 | 7474 | 1 | 2 | 2 | 3 | 4 | 5 | 5 | 6 | 7 |
| 56 | 7482 | 7490 | 7497 | 7505 | 7513 | 7520 | 7528 | 7536 | 7543 | 7551 | 1 | 2 | 2 | 3 | 4 | 5 | 5 | 6 | 7 |
| 57 | 7559 | 7566 | 7574 | 7582 | 7589 | 7597 | 7604 | 7612 | 7619 | 7627 | 1 | 2 | 2 | 3 | 4 | 5 | 5 | 6 | 7 |
| 58 | 7634 | 7642 | 7649 | 7657 | 7664 | 7672 | 7679 | 7686 | 7694 | 7701 | 1 | 1 | 2 | 3 | 4 | 4 | 5 | 6 | 7 |
| 59 | 7709 | 7716 | 7723 | 7731 | 7738 | 7745 | 7752 | 7760 | 7767 | 7774 | 1 | 1 | 2 | 3 | 4 | 4 | 5 | 6 | 7 |
| 60 | 7782 | 7789 | 7796 | 7803 | 7810 | 7818 | 7825 | 7832 | 7839 | 7846 | 1 | 1 | 2 | 3 | 4 | 4 | 5 | 6 | 6 |
| 61 | 7853 | 7860 | 7868 | 7875 | 7882 | 7889 | 7896 | 7903 | 7910 | 7917 | 1 | 1 | 2 | 3 | 4 | 4 | 5 | 6 | 6 |
| 62 | 7924 | 7931 | 7938 | 7945 | 7952 | 7959 | 7966 | 7973 | 7980 | 7987 | 1 | 1 | 2 | 3 | 3 | 4 | 5 | 6 | 6 |
| 63 | 7993 | 8000 | 8007 | 8014 | 8021 | 8028 | 8035 | 8041 | 8048 | 8055 | 1 | 1 | 2 | 3 | 3 | 4 | 5 | 5 | 6 |
| 64 | 8062 | 8069 | 8075 | 8082 | 8089 | 8096 | 8102 | 8109 | 8116 | 8122 | 1 | 1 | 2 | 3 | 3 | 4 | 5 | 5 | 6 |
| 65 | 8129 | 8136 | 8142 | 8149 | 8156 | 8162 | 8169 | 8176 | 8182 | 8189 | 1 | 1 | 2 | 3 | 3 | 4 | 5 | 5 | 6 |
| 66 | 8195 | 8202 | 8209 | 8215 | 8222 | 8228 | 8235 | 8241 | 8248 | 8254 | 1 | 1 | 2 | 3 | 3 | 4 | 5 | 5 | 6 |
| 67 | 8261 | 8267 | 8274 | 8280 | 8287 | 8293 | 8299 | 8306 | 8312 | 8319 | 1 | 1 | 2 | 3 | 3 | 4 | 5 | 5 | 6 |
| 68 | 8325 | 8331 | 8338 | 8344 | 8351 | 8357 | 8363 | 8370 | 8376 | 8382 | 1 | 1 | 2 | 3 | 3 | 4 | 4 | 5 | 6 |
| 69 | 8388 | 8395 | 8401 | 8407 | 8414 | 8420 | 8426 | 8432 | 8439 | 8445 | 1 | 1 | 2 | 2 | 3 | 4 | 4 | 5 | 6 |
| 70 | 8451 | 8457 | 8463 | 8470 | 8476 | 8482 | 8488 | 8494 | 8500 | 8506 | 1 | 1 | 2 | 2 | 3 | 4 | 4 | 5 | 6 |
| 71 | 8513 | 8519 | 8525 | 8531 | 8537 | 8543 | 8549 | 8555 | 8561 | 8567 | 1 | 1 | 2 | 2 | 3 | 4 | 4 | 5 | 5 |
